
# දඟ ම දඟයාට යස පාඩම



පසන්දී තරුල්යා සෝමරත්න

# දඟ ම දඟයාට යස පාඩම

පසන්දී තරුල්යා සෝමරත්න

කතෘගේ වෙනත් කෘති: හිතුවක්කාර ගිරා පැටියා

කෘතිය පළ කරන දින : 2025 පෙරවාරි 08

ISBN978-624-208-250-9

# පිදුම


දෛවයට පෙර හුරු ගැන්වූ
දහමින් මුල් පිටු රසවත් කළ
දැනුමෙන් මගේ ලොව එළිය කළ
ආදරණීය සිසිරා චන්ද්‍රලතා ගුරු මෑණියන්ටත්
ගයත්‍රි සෙනෙවිරත්න ගුරු මෑණියන්ටත්
ආදර ගෞරවයෙන් පුද කරමි!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එකෝමත් එක ගමක ලස්සන ම ලස්සන ගෙවත්තක් තිබුණා. මේ ගෙදර අම්මා යි, තාත්තා යි, පුතා යි ජීවත් වුණා.



ගෙවත්තේ ගොඩාක් ලස්සනට එළවළු,පලතුරු ,
පාට පාට මල් වර්ග හදන්න අම්මා හුඟාක්
මහන්සි වුණා.



මේ ලස්සන ගෙදර හිටිය පුංචි පුතා හරි ම දඟයෙක්. එළවළු, පලතුරු කන්න, පාට පාට මල්වල පැණි බොන්න එන කුරුල්ලන්ට, ලේන්නුන්ට සමනලයින්ට හිරිහැර කරනවා



“පුතේ,සත්තුන්ට හිරිහැර කරන්න එපා” අම්මා කිව්වා. ඒත් මේ දඟයා අම්මා කියන දේ අහන්නෙ ම නෑ.


ඔන්න දවසක් මේ දඟයා වත්ත පුරා එහෙට මෙහෙට දුව දුව ගෙවත්තට ආව සතුන්ට හිරිහැර කරන්න පටන් ගත්තා.



සමනල්ලු අල්ලලා බෝතල් වලට දාලා, ලේන්නුන්ට ගල් ගහලා, කුරුල්ලන් එළවලා හරි ම දඟ වැඩ ගොඩයි.




ලස්සනට පිපුණු රෝස මල් වල පැණි බොන්න ආව මී මැසි රංචුවක් එහෙට මෙහෙට පියාඹනවා මේ දඟයා දැක්කා.



“අද නම් මම මී මැස්සෙක් අල්ල ගන්නවාමයි” කියලා දඟයා හිතුවා.හිමින් සැරේ මී මැස්සෙක් අල්ල ගන්න පැන්නා. මී මැස්සා හොඳට ම බය වෙලා දඟයාගේ අතට විද්දා.



"ආව්..... ආව්....මට රිදෙනවා "දහයා හොඳට ම අඬන්න පටන් ගත්තා. මේ සද්දේ ඇහුණු අම්මා එතනට දුවගෙන ආවා. අම්මා ට වෙලා තියෙන දේ තේරුණා.



“ඒක තමයි පුතේ, ඔයාට වගේම අනෙක් අයටත් රිදෙනවා. ආයෙත් සතුන්ට කරදර කරන්න එපා” කියලා අම්මා දඟයාගේ අතට බෙහෙත් දැම්මා.



“ඔව් අම්මේ , මම අයෙනම් කවදාවත් කාටවත් රිදවන්නෙත් නෑ, කරදර කරන්නෙත් නෑ” කියලා දඟයා හිරකරගෙන හිටිය සත්තු ඔක්කොම නිදහස් කළා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්